# පධානසර ආරාමයන් හා බද්ධ ස්වභාවික පරිසරය

ජේ.එම්.අයි.ආර්.කේ. ජයසේකර[41]

මහින්දාගමනය සමග ලද ආගමික පසුබිම මෙරට ඉදිකිරීම් ක්ෂේත්‍රය කෙරෙහි ඍජු බලපෑමක් එල්ලකර ඇත. භික්ෂූන් වහන්සේලගේ හා වාස්තුවිද්‍යාඥයින්ගේ උපදෙස් මත ඉදිවූ නිර්මාණ අතර ස්තූප, වටදාගෙය, පිළිමගෙය, බෝධිඝර, උපොසතඝර, පබ්බතාරාම මෙන් ම පධානඝර ආදිය ඉතා සුවිශේෂී නිර්මාණ වේ. වන වාසී භික්ෂූන් වෙනුවෙන් නිමවූ ආගමික හා කලාත්මක ගොඩනැගිලි විශේෂයක වශයෙන් පධානඝර හඳුන්වාදිය හැකිය. පදානඝර පිළිබඳ තොරතුරු සපයන සාහිත්‍ය මූලාශ්‍ර ලෙස මහාවංසය , සමන්තපාසාදිකාව, රසවාහිණිය, පාලි බෝධිවංසය , සද්ධර්මාලංකාරය හා දම්පියාඅටුවා ගැටපදය මෙන්ම සෙල්ලිපි මූලාශ්‍ර වශයෙන් පෙරියම්කුලම ලිපිය , මැදිරිගිරිය ටැම් ලිපිය , මන්නාරම් කච්චේරි ටැම් ලිපිය,අනුරපුර පුවරු ලිපිය, මිහින්තලා පුවරු ලිපිය, ආදිය දැක්විය හැකි ය. මෙ රට ආගමික වාස්තුවිද්‍යාව පිළිබඳ සැළකීමේ දී ප්‍රධාන වහයෙන් විවෘත හා සංවෘත වශයෙන් කොටස් දෙකක් වන අතර පධානඝර මෙයින් දෙවැනි කොටස වන ආගමික වත් පිළිවෙත් සඳහා බහුලව යොමු වූ ගොඩනැගිලි විශේෂයට අයත් වේ. අඩු පිරිසක් ගැවසෙන නගරයට ඈතින් කඳු, වනපෙත් ආශ්‍රය කර ගෙන නිර්මාණය වන මෙම ගොඩනැගිලි 7,8 සියවස්වල වර්ධනිය වී ඇත.අනුරාධපුර බටහිරාරාමය, කිරලාගල, තන්ත්‍රිමලේ, මාලිගාගොඩැල්ල, වෙහෙරබැදිගල, රිටිගල, අරන්කැලේ, නාගොල්ල, කළුදිය පොකුණ වැනි ස්ථාන වල දක්නට ලැබේ. පධානඝර පිළිබඳ මූලික අධ්‍යයනය එච් සී පී බෙල් මහතා විසින් අධ්‍යයනය කරන අතර ඔහු මේවා ද්වීත්ව වේදිකා ගොඩනැගිලි ලෙස හඳුන්වයි. 1924 දී හෝර්කාට් මහතා විසින් පූර්ණ ලෙස අනුරාධපුර බටහිරාරාමය වාර්තා කරයි. ඔහු ගල් වඩු තාක්ෂණය අනුව මෙවා වර්ග 06 කට බෙදා දක්වායි. 1974 දී සේනක බණ්ඩාරනායක මහතා විසින් මේවා අධ්‍යයනය කර අදියර තුනකට බෙදා ඇත. 1995 දී ගාමිණී විජේසූරිය මහතා ද මේ පිළිබඳ අධ්‍යයනය කරයි. පැරණි වාස්තුවිද්‍යාඥයින් සිය ගොඩනැගිලි නිර්මාණය කිරීමේදී ස්වභාවික පරිසරයට ප්‍රබල බලපෑමක් අයුරින් විශාල වශයෙන් වෙනස් නොකරයි. පරිසරයට උචිත වන ආකාරයට අනුරූපවන අයුරින් එම නිර්මාණය හැඩගන්වාගෙන තිබේ. විශේෂයෙන් පධානඝර ගත් විට බොහෝ විට පර්වත ආශ්‍රය කර ගෙන නිමවා ඇත. ඒ අනුව එම පරිසරයට උචිත අයුරින් මෙම ගොඩනැගිලි වල අවශේෂ අගයන් හැඩගන්වා ඇත. ද්විත්ව වේදිකා , පොකුණු . ප්‍රාකාර බැම්, පියගැට පෙළ , චංකමනඝර ආදිය එම ගොඩනැගිල්ල පිහිටි පරිසරයට අනුව නිමවීම හඳුනාගත හැකිය.මෙම ගොඩනැගිලි පරිසරය හා බද්ධවන අයුරු අනුරාධපුර බටහිරාරාමය ආමෙම ගොඩනැගිලි පරිසරය හා බද්ධවන අයුරු අනුරාධපුර බටහිරාරාම ආශ්‍රයෙන් මැනවින් හඳුනාගත හැකි වේ. ඒ අනුව මෙම ගොඩනැගිලි නිමවීමේ දී පරිසරය විශාල ලෙස වෙනස් නොකර එය පරිසරයට උචිත ලෙස ගොඩනැගිලි හා අනෙකුත් අංගයන් හැඩගන්වාගෙන තිබෙන බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ පධානඝර, ගොඩනැගිලි, පරිසරය.

[41] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.